# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/78 - 2019 මැයි මස 17 වැනි සිකුරාදා - 2019.05.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මහියංගනය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මහියංගනය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද.

ඉහත කී ආඥාපනතේ 66අ (1)(අ) වගන්තිය යටතේ මහියංගනය ප්‍රාදේශීය සභාවේ අංක 06 දඹාන කොට්ඨාසයට තේරී පත්වූ දිසානායක මුදියන්සේලාගේ ශ්‍යාමලී කුමාරි දිසානායක අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම මහියංගනය ප්‍රාදේශීය සභාවේ අංක 06 දඹාන කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අකුරුගොඩ කළු ආරච්චිලාගේ මානෙල් අසෝකමාලා කළුආරච්චි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මහියංගනය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, එච්. අයි. ආර්. හතුරුසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් අකුරුගොඩ කළු ආරච්චිලාගේ මානෙල් අසෝකමාලා කළුආරච්චි, මහියංගනය ප්‍රාදේශීය සභාවේ අංක 06 දඹාන කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එච්. අයි. ආර්. හතුරුසිංහ,
තේරීම්භාර නිලධාරී,
මහියංගනය ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 16 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

05 - 944


1A - G 30113 — 27 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*